# 2. දිවා රෑ

සමන් කියලා පුංචි පිරිමි ළමයෙක් හිටියා. එයා හැම දා ම උදෙන් ම නැගිටලා වත්ත පහළට දුවගෙන යනවා. උදේට මල් පිපෙන හැටි බලන්නත්, කුරුල්ලන් නාද කරන හැටි අහන්නත් සමන් හරි ම කැමතියි.

සමන් හරිම කඩිසර ළමයෙක්, පාසලේදීත්, ගෙදරදීත් සතුටින් වැඩ කටයුතු කරනවා.

රෑට අහස දෙස බලන් ඉන්නත් සමන් හරි ම ආසයි. සමන් අහස දෙස බලාගෙන අහසේ තරු ගණන් කරනවා. ඒ වගේ ම කළුවරේ ගස් සෙලවෙන හැටි බලන් ඉන්නවා. සමන්ගේ නංගී සාමාත් සමහර දවස්වල සමන්ට එකතු වෙනවා. දවාලේ කළ වැඩ ගැන ඔවුන් කතා කරනවා.

ගේ මිදුලේ ගල්වැටිය උඩ වාඩි වෙලා සමන් හා සාමා ගී කියනවා.



මල් පුබුදින හැටි බලන්න - කුරුලු ගීත නද අහන්න
පාසල වෙත පිය තගන්න - සතුටින් වැඩපළ කරන්න
දවාලේ හැකි තේ දෝ //

හිතැහෙන තරු දෙස බලන්න - හතිකට තරු ටික ගතින්න
ඉගිලෙන කුරුලන් දකින්න - විවේක සුවයෙන් සිටින්න
රුයේ දී හැකි තේ දෝ //



දවසක් සමන්ගේ ගුරුතුමී, දේව පියා දවල් හා රැය මැවූ ආකාරය පන්තියේ දී කියා දුන්නා. බයිබලයෙන් ඒ ගැන පන්තියට ඇහෙන්න කියෙවුවා.

ඉතින් එදා රෑ සමන් එයාගේ බයිබලයත් අරන් වෙන දා වගේ ම ගල්වැටිය උඩ වාඩි වෙලා නංගීටත් මේ කතාව කියා දුන්නා. නංගීට හරි ම සතුටුයි.

දෙන්න ම එකතු වෙලා දවල් රෑ මවා, ලෝකය ලස්සන කළ දේව පියාට පැසසුම් ගී කිවුවා.

## පැවරුම්

1. දහවල් කාලයේ ඔබට දක්නට ඇති ලස්සන ලෝකය ගැන දෙවි පියාට ස්තුති දෙන යාච්ඤාවක් කරන්න.

2. රාත්‍රී කාලයට පරිසරයේ දකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.